**රත්තොට ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

**-----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-----------

මෙම වාර්තාවේ 1.3. ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු කැබ් රථයේ වටිනාකම රු.5,760,000ක් අඩුවෙන්ද, 2012 වර්ෂයේදී ලැබී තිබුණු පිරිවැය රු.1,800,000ක් වූ ට්‍රැක්ටරයේ සහ සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ටිපර් රථයේ වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ). එකතු වටිනාකම රු.417,000ක් වූ යන්ත්‍ර උපකරණ විෂයයන් 03ක හා ප්‍රදානයක් ලෙස ලැබී තිබූ උපාංග සහිත පරිගණක 04ක්, ස්කෑන් සහිත ප්‍රින්ටරයක හා ජායා පිටපත් යන්ත්‍රයක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඇ). සභාව සතු ඉඩම් 06 ක හා ගොඩනැගිලි 29 ක වටිනාකම සහ 2012 වර්ෂයේදී රු.639,458ක වියදමින් ඉදිකර තිබුණු කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ). එකතු වටිනාකම රු.150,209ක් වූ ගොඩනැගිලි 04ක් ඉවත් කර, ඒ වෙනුවට නව ගොඩනැගිලි ඉදිකර තිබුණු නමුත්, ගිණුම්වල ඊට අදාල ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). ගෙවිය යුතු රු.94,776ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණු අතර, එකතුව රු.152,662ක් වූ ණයහිමි ශේෂ 04 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් උකුවෙල ප්‍රාදේශීය සභාවට ලැබී, එම සභාව විසින් රත්තොට ප්‍රාදේශීය සභාවට ලබා දී තිබුණු ගැල්වනයිස් බට 296න් සභාව සතුව පවතින ගැල්වනයිස් බට 130හි රු.143,910ක්වූ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.9,984,786ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.540,477ක අසමානතා නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

---------------------

වසර 17ක සිට අවලව ඉදිරියට ගෙනෙමින් පවතින රු.15,462ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවරගෙන නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09ක එකතුව රු.47,132,165ක් වූ අතර, වසර 05කට වැඩි කාලයක් ඉක්ම වූ එකතුව රු.2,328,811ක ශේෂ 06ක්ද ඊට ඇතුළත්වී තිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 02ක එකතුව රු.42,027,350ක් වූ අතර, වර්ෂ 05කට වැඩි කාලයක් ඉක්ම වූ රු.4,207,443ක ශේෂ 02ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.75,804,282ක් වූ ගිණුම් විෂයයන් 07කට අදාළ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.7 නීති,රීති ,රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(i) හා (xi) වගන්ති හා 1986 ජූනි 17 දිනැති අංක 1986/6 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබානොගෙන ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් රත්තොට මහජන බැංකුවට බදු දී තිබුණු අතර, චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූල නොවී අවුරුදු 50 ක කාලයකට බදු දී තිබුණි. |
| (ආ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන)රීති මාලාව | |
| (i).114 රීතිය | ඉදිකිරීම් ආරම්භ නොකල ව්‍යාපෘති සඳහා රු.550,000ක අත්තිකාරම් මුදල් ගෙවා තිබූ අතර, එම අත්තිකාරම් මුදල් පියවා ගැනීමටද කටයුතු කර නොතිබුණි. |
| (ii).218 රීතිය | සභාවේ දේපළ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර, සභාවේ දේපළ අවිධිමත්ව බදු දී අනවසර ඉදි කිරීම් සඳහා ඉඩකඩ ලබා දී තිබුණි. එමෙන්ම සභාවට අයත් රත්තොට පොලීසිය පිහිටි ඉඩමද පවරා දීමේ කටයුතු සිදු කරමින් තිබුණි. |
| (ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 සහ 571 රෙගුලාසි | වසර 2ක කාලයක් ඉක්මවූ එකතුව රු.1,522,915ක තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ). 2014 නොවැම්බර් 12 දිනැති අංක 25 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවී දීමනා ලබමින් සිටි සේවකයින් 07 දෙනෙකුට ස්ථිර තනතුරු ප්‍රදානය කර තිබූ අතර, අනුමත නොවූ තනතුරු සඳහා පුද්ගලයන් 13 දෙනෙකු බඳවාගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,540,055 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,759,963ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.780,092ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02ක කාලපරිච්ඡේදය තුල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ). මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ අඛණ්ඩ පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

(ආ). මුළු ආදායම සහ වියදම අතර අනුපාතයේ අඛණ්ඩ ඉහළ යාමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනයේදී සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම් බදු

හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,001,480ක් වූ අතර, එම ශේෂය තුල වසර 05ක කාලයක් ඉක්මවූ රු.341,407ක ශේෂ ඇතුළත් වී තිබුණි.

#### 2.3.2 බදු කුලී

හිඟහිටි බදු කුලී ගිණුමේ ශේෂය රු.775,260 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂයකට වඩා පෙර සිට පැවත එන රු.501,148ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.3 අක්කර බදු

--------------

හිඟහිටි අක්කර බදු ශේෂය රු.356,762ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 05 ක කාලයක් ඉක්ම වූ රු.104,857ක ශේෂ ඇතුළත්වී තිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.408,685ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂ 03ක කාලයක් ඉක්මවූ රු.339,955ක ශේෂ ඇතුළත්ව තිබුණි.

2.3.5 ජල ගාස්තු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟ ශේෂයෙන් රු.2,687,601ක් සහ වර්ෂයට අදාල ගාස්තුවෙන් රු.2,758,107ක හිඟයක්ද ඇතුළුව වර්ෂය අවසානයට වූ මුළු හිඟය රු.5,445,708ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.ආදායම් රැස් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,483,189ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.3,359,575ක මුදලක් අයවිය යුතුව තිබුණි. 2011 හා 2012 යන වර්ෂ දෙක වෙනුවෙන් අයවිය යුතුව තිබූ රු.300,435ක්ද උසාවි දඩ ශේෂයට ඇතුළත් වී තිබුණි.

2.4 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයකදී පනවන ලද අධිභාරයකට අදාලව රු.677,500ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). රත්තොට මහජන බැංකුව සමඟ සභාව විසින් එළඹී තිබුණු බදු ගිවිසුමේ කොන්දේසි පරිදි, 2003 වර්ෂයේ සිට බදු මුදල් ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ආ). මයිලෝමීටරය ක්‍රියාවිරහිතව තිබූ වාහන 03කට සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.294,562ක් වූ ඉන්ධන ලබා දී තිබුණි.

(ඇ). 2012 වර්ෂයේදී සිදු කර තිබුණු නව වරිපනම් බදු තක්සේරුව අනුව වරිපනම් බදු අය නොකර, 2004 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකිරීම නිසා සැලකිය යුතු ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු ජල ව්‍යාපෘති 11ක් මඟින් පාරිභෝගිකයන් 3510 කට ජලය බෙදා හැර තිබුණු නමුත්, ඉන් ජල මනු සවි කර තිබුණේ පාරිභෝගිකයන් 47 දෙනෙකුට පමණි. ඉතිරි පාරිභෝගිකයින් 3463 දෙනාගෙන් කිසිදු පදනමක් නොමැතිව ගාස්තු අයකර තිබුණි.

(ආ). රත්තොට පොලිස් නිවස හා පොලීසිය පිහිටි ගොඩනැගිල්ල 2011 වර්ෂයේදී පිළිවෙලින් මසකට රු.1,750කට හා රු.7,500කට තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදීත් තක්සේරුව පරිදි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව රු.179,060ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ). වර්ෂ ගණනාවක සිට වැඩිවෙමින් ඉදිරියට එන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.3,124,957ක් වූ දායක මුදල් ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ). ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියෙන් 2006 වර්ෂයේ සිට ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරියට ගෙන එන රු.633,836ක ශේෂය නිරවුල් කර ගැනීමට නොහැකි වී තිබුණි.

3.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
----------------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පිරිවැය රු.1,417,500ක් වූ වාහන 04ක් ද, වටිනාකම ගණනය කර නොමැති අත් ට්‍රැක්ටරයක්ද නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ). රු.703,362ක් වැයකර 2010 වර්ෂයේදී ඉදිකර තිබූ ගම්මඩුව පාර මල්ශාලාව කිසිදු ප්‍රයෝජනයකට යොදවා නොගෙන වසා දමා තිබුණි.

3.4 හඳුනාගත් අලාභ

---------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් නැඟුම ප්‍රතිපාදන යටතේ රත්තොට ළමා උද්‍යානය ඉදිකිරීම සඳහා රත්තොට සමෘද්ධි නිලධාරීන්ගේ සංගමය වෙත 2014 දෙසැම්බර් 30 දින රු.975,000ක් වූ ඇස්තමේන්තු මුදල ගෙවා තිබුණි. උපකරණ මිලදීගෙන තිබූ ආයතනයේ බිල් පතෙහි දැක්වෙන මිල ගණන් වලට වඩා සභාවේ ඇස්තමේන්තුව වැඩි වීම නිසා රු.154,381 ක පාඩුවක් සභාවට සිදු වී තිබුණු අතර, 2015 පෙබරවාරි 25 දින වන විටත්, ළමා උද්‍යානය ඉදිකර නොතිබුණි.

3.5 ව්‍යාපෘති ප්‍රමාද කිරීම.

-------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බණ්ඩාරපොල සේරුගොල්ල ජනපදයට ජලය ලබා දීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2015 අප්‍රේල් 22 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ). ජලය රැස් කිරීමේ ටැංකියේ කොටසක් පමණක් මීටර් 4.3 x 3.0 x 1.17 ප්‍රමාණයට ඉදිකිරීමෙන් අනතුරුව කර්මාන්තය අතහැර දමා තිබුණි.

(ආ). ව්‍යාපෘතිය සඳහා රු.200,000ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණද, එම අත්තිකාරම් මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2ක පමණ අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටරයක් හා සේවකයින් 07 දෙනෙකු යොදවා එකතු කර, එයින් වෙන්කරන ලද ඝන අපද්‍රව්‍ය කිලෝග්රෑම් 400ක ප්‍රමාණයක් ගොඩ ක්‍රමය මඟින් දිරාපත් වූ පසු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගෙන තිබුණි.ඉතිරි සියයට 80ක පමණ ප්‍රමාණය ප්‍රතිචක්‍රීකරණයට යොමු නොකර පරිසරයට හානි වන අයුරින් බැහැර කිරීමට පියවර ගෙන තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.2 විගණන හා කළමණාකරණ කමිටු

---------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/ සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එකී කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ). ආදායම් විෂයයන් 05ක රු.410,000ක් වූ ඇස්තමේන්තුගත ආදායම් වලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 07ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 33 සිට සියයට 82 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

(ආ). වැය විෂයයන් 11ක් සඳහා වූ රු.2,285,000ක සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, තවත් වැය විෂයයන් 32ක ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 8 සිට සියයට 99 දක්වා වූ පරාසයක විචලනයන් පැවතුණි.

4.4 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------------------------------

සභාව වෙත ඉදිරිපත් කර තිබුණු විගණන විමසුම්වලින් විමසුම් 16කට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු.138,400,436ක් විය.

5. පද්ධති හා පාලන
-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරුනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). වාහන පාලනය

(ඉ). ණයගැති සහ ණයහිමි පාලනය

(ඊ). කාර්ය මණ්ඩල කළමනාකරණය

(උ). ගබඩා පාලනය

(ඌ) කොන්ත්‍රාත් පාලනය